මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2026.10. 14

# ප්‍රවෘත්ති නිවේදනය

ප්‍රවෘත්ති අධ්‍යක්ෂතුමා / කළමනාකාරතුමා,

**ශ්‍රී ලංකා රේගුව ඔක්තෝබර් 13 වන දිනට රුපියල් බිලියන 2208ක ආදායමක් රැස්කරමින් 2026 වසරේ ආදායම් ඉලක්කය අභිබවයි**

ශ්‍රී ලංකා රේගුව 2026 වර්ෂය සඳහා රුපියල් බිලියන 2207ක් වූ සිය ආදායම් ඉලක්කය ඔක්තෝබර් 13 වන දිනට සම්පූර්ණ කර ඇති බව ශ්‍රී ලංකා රේගුව දැනුම් දෙයි. ඒ අනුව, ඔක්තෝබර් 13 වන දින වනවිට ශ්‍රී ලංකා රේගුව 2026 වර්ෂය සඳහා රැස්කළ සම්පූර්ණ අදායම රුපියල් බිලයන 2208ක් වේ.

ශ්‍රී ලංකා රේගුව 2025 වසරේදී සිය ආදායම් ඉලක්කය වූ රුපියල් බිලියන 2115ක ආදායම 2025 නොවැම්බර් 11 වන දින සම්පූර්ණ කරන ලදි. 2026 වසරේ ආදායම් ඉලක්කය 2025 වසරේ ආදායම් ඉලක්කයට වඩා ඉහළ වුවත්, එම ආදායම් ඉලක්කය ඊටත් වඩා අඩු කාලයකින් සම්පූර්ණ කර ගැනීමට රේගුව මෙවර සමත්ව ඇත.

2025 වසරේ ආදායම් ඉලක්කය සම්පූර්ණ කිරීමෙන් පසුව සංශෝධිත ආදායම් ඉලක්කය ලෙස රුපියල් බිලියන 2231 දක්වා ආදායම් ඉලක්කය ඉහළ දැමුණු අතර, 2025 වසර අවසානයේදී එම සංශෝධිත ආදායම් ඉලක්කයද අභිබවමින් රුපියල් බිලියන 2557.5ක දැවැන්ත ආදායමක් රැස්කර ගැනීමට රේගුව සමත් විය.

රේගු කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ඔක්තෝබර් 01 වැනිදා සිට රේගු ප්‍රකාශන ඉදිරිපත් කිරීම ඩිජිටල් අත්සන භාවිතා කිරීම ආරම්භ කළ අතර, ඔක්තෝබර් 19 වන දින සිට රේගු ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්පූර්ණයෙන්ම ඩිජිටල් අත්සන සහිතව පමණක් සිදුකරන අතර පැරණි ක්‍රමයට ඉදිරිපත් කරන ලිපිද්‍රව්‍ය භාරගැනීම අවසන් කරනු ඇත.

ශ්‍රී ලංකා රේගුවේ ආදායම් රැස් කිරීමේ කටයුතු කාර්යක්ෂම කිරීමත් සහ වංචා දූෂණ අවම කරමින් කටයුතු කිරීමත් නිසා කෙටි කලකින් රේගු ආදායම් අපේක්ෂිත ඉලක්ක අභිබවා යාමට මෙසේ සමත්ව ඇත. රේගු ප්‍රකාශන ක්‍රියාවලිය ඩිජිටල්කරණය ඇතුළු නව ප්‍රතිසංස්කරණවලින් පසුව රේගු කටයුතු තවත් කාර්යක්ෂම වනු ඇත.

ඉහත ප්‍රවෘත්තිය ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් ඔබ ආයතනය දක්වන සහයෝගය ඉතා අගයකොට සලකමි.

පී.ආර්. චතුර්ක මධුශාන්
ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01

චතුර්ක මධුශාන්
ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය